**ලංකා ධීවර සංස්ථාව - 2016**

**---------------------------------------------**

ලංකා ධීවර සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-------------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2018 අප්‍රේල් 19 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පැවැත්වීම

**-------------------------------------------------**

සංස්ථාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

### 2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම

**-------------------------------------**

සංස්ථාව විසින් අවසන්වරට පිළියෙල කර විගණනය කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්,බැරකම්,ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
| --- | --- |
| | රු. |
| ජංගම නොවන වත්කම් | 1,713,458,355 |
| ජංගම වත්කම් | 449,150,463 |
| මුළු වත්කම් | 2,162,608,818 |

============

බැරකම්
-----------

| | |
|---|---|
| ජංගම බැරකම් | 864,474,891 |
| ජංගම නොවන බැරකම් | 205,984,946 |
| | 1,070,459,837 |
| ශුද්ධ වත්කම්/අයිතිය | 1,092,148,981 |
| මුළු බැරකම් | 2,162,608,818 |
| මුළු ආදායම් | 2,597,580,607 |
| මුළු වියදම් | 2,857,498,081 |
| ඌනතාවය | (259,917,474) |

## 2.4 ලැබිය යුතු ගිණුම්
---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ණය ශේෂය රු.214,407,034 ක් විය. මෙම ශේෂය තුළ වර්ෂ 02 ට වැඩි රු.44,144,301 ක් වර්ෂ 05 ට වැඩි රු.44,703,875 ක් ද වසර 10 වැඩි රු.7,251,427 ක් ද විශ්ලේෂණය කළ නොහැකි ශේෂය රු.18,768,308 ක් ද ඇතුළත් වී තිබුණි.

(ආ) බාහිර ආයතන හා පුද්ගලයින් විසින් ධීවර සංස්ථාවේ ශීතාගාරය තුළින් අධිශීතකරණ පහසුකම් ලබාදීම සඳහා ලබාදෙන මත්ස්‍ය තොග භාරගැනීමේදී හා ඒවා පසුව නිකුත්කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. කළමනාකරණය විසින් ශීතාගාර ගාස්තු ලෙස 2016 අගෝස්තු වන විට රු.4,014,847 ක් අයවිය යුතුව පැවතියදී වසර 02 කට අධික කාලයක් ගත වී ඇතත් අයකර ගැනීමකින් තොරව පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.
---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය | සංස්ථාවේ සේවකයන් රේඛීය අමාත්‍යාංශයේ හෝ වෙනත් ආයතනයකට නිදහස් කරන්නේ නම් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගතයුතු වුවද , එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් දෙදෙනෙකු බාහිර |

| | |
|---|---|
| | ආයතන වෙත මුදාහැර රු.397,446 ක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. |
| (ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 24/2014 හා 2015 පෙබරවාරි 11 දිනැති අංක 5/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විශ්‍රාමික රජයේ නිලධාරියෙකු සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයා ලෙස පත්කර තිබූ අතර එම නිලධාරියාට විශ්‍රාම වැටුප් සමඟ ජීවන වියදම් දීමනාව ගෙවා තිබුණු අතර සාමාන්‍යාධිකාරී දීමනාව සමඟද 2015 නොවැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා රු.249,200 ක් ජීවන වියදම් දීමනා එකතුකර ගෙවා තිබුණි. |

## 2.6 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සමාලෝචිත වර්ෂය අවසානය වන විට පරිභෝජනයට නුසුදුසු තත්ත්වයේ සහ කල් ඉකුත්වූ මසුන් අලෙවිකිරීම හේතුවෙන් බාහිර පාර්ශවයන් විසින් සංස්ථාවට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණවල නඩු 04 ක් පවරා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 ඔක්තෝබර් 01 දිනැති අංක 14/186 දරන අති විශේෂ ගැසට් පත්‍රය හා 2011 ජූනි 30 දිනැති අංක 1712/ 21 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපිත කර තිබූ ලංකා ධීවර සංස්ථාවේ ආරම්භක අරමුණු පහත පරිදි සාරාංශ කර දැක්වේ.

- සෘජුව හෝ බලයලත් ඒජන්තවරු මාර්ගයෙන් දියඹ මුහුදේ ට්‍රෝලර් යාත්‍රා යොදා මසුන් මැරීමේ කටයුතු , සකස්කිරීමේ කටයුතු සහ තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් මසුන් අලෙවිකිරීමේ හෝ බෙදාහැරීමේ කටයුතු ඉටු කිරීම, ශීත කාමර ඇතුළු ධීවර වරායන් හා නැංගුරම් පොලවල් ඉදිකිරීම, නඩත්තු කිරීම, මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයන් ආනයනය කිරීම හා අපනයනය කිරීම, ධීවර කර්මාන්තය සඳහා ආම්පන්න උපකරණ හා වෙනත් අවශෝෂ්‍යපකරණ ආනයනය කිරීම හා විකිණීම.

- ධීවර දෙපාර්තමේන්තුව හෝ රජයේ වෙනයම් දෙපාර්තමේන්තුවක් සඳහා සහ ඒ වෙනුවෙන් ධීවර කර්මාන්තය සංවර්ධනයට අදාල කටයුතුවල නියැලීම, ධීවර කර්මාන්තය සඳහා බෝට්ටු හා වෙනත් කුඩා යාත්‍රා තැනීම, ධීවර බෝට්ටු අළුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පහසුකම් සැපයීම සහ ධීවර අවශෝෂ්‍යපකරණ නිපදවීම හා විකිණීම.

  මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, සීමාසහිත සී - නෝර් පදනම හා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය යන ආයතන ධීවර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමත් සමඟ මෙම සංස්ථාව වෙත පැවරි තිබූ ඉහත ව්‍යවස්ථාපිත අරමුණු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත වූ අනෙක් ආයතනවල විෂයය පථයට පැවරී තිබුණත් ධීවර සංස්ථාව ස්ථාපිත කිරීමේදී සංස්ථාව වෙත පැවරී තිබූ කාර්යය භාරය සංශෝධනය කිරීම සම්බන්ධව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) කාර්ය සාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම්හි ඉලක්ක ඉටුකරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2,592 ක් වැයකර මසුන් මෙට්‍රික් ටොන් 7200 ක් මිලදීගැනීමට ඉලක්ක කර තිබුණද, ප්‍රගති වාර්තා අනුව රු.මිලියන 1,381 ක් පමණක් වැයකර මසුන් මෙට්‍රික් ටොන් 3329 ක් පමණක් මිලදීගෙන තිබුණි. ඒ අනුව මෙට්‍රික් ටොන් 3871 ක් හෙවත් සියයට 53 ක් වූ මසුන් අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකි වී තිබුණු අතර, මසුන් මෙට්‍රික් ටොන් 7200 ක් විකුණුම් කර රු.මිලියන 3,375 ක ආදායමක් ලැබීමට ඉලක්ක කර තිබුණද මෙට්‍රික් ටොන් 3329 ක් පමණක් අලෙවි කර රු. රු.මිලියන.1,915 ක ආදායමක් පමණක් ලබාගෙන තිබුණි. ඒ අනුව විකුණුම් ඉලක්ක සියයට 46 කින් ළඟාකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ආයතනයේ ප්‍රධාන අරමුණ වන සහනදායී මිළකට පාරිභෝගිකයාට මසුන් සැපයීම තුළින් එදිනෙදා පාරිභෝගිකයාගේ මසුන් අවශ්‍යතාවය සපුරාලීමේ කාර්යය සම්පූර්ණ කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ii) අයිස් විකුණුම් මෙට්‍රික් ටොන් 26064 ක් සඳහා රු.මිලියන.107.76 ක අලෙවි ආදායමක් ලබාගැනීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මෙට්‍රික් ටොන් 11843 ක් පමණක් අලෙවි කර රු.මිලියන 44.95 ක ආදායමක් ලබාගෙන තිබුණි. මේ අනුව සැලසුම් කල පරිදි සියයට 55 ක අයිස් විකුණුම් ඉලක්කයට ළඟා වීමට නොහැකි වී තිබුණි.

(iii) ශීතාගාර ආදායම් රු.මිලියන 60 ක් ඉලක්ක කර තිබුණද රු.මිලියන. 14.47 ක් පමණක් උපයා තිබුණි. මේ අනුව සංස්ථාවේ පවතින ශීතාගාර පහසුකම් ඌන උපයෝජනය කර තිබුණු බවට නිරීක්ෂණය විය.

(iv) සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 22 ක් වැයකර මසුන් අලෙවිසැල් 32 ක් ඉදිකර මහජන අයිතියට පැවරීමට සැලසුම්කර තිබුණද රු. මිලියන 4.28 ක් වැයකර අලෙවිසැල් 11 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී ඉදිකර තිබුණි.

(ඇ) පසුගිය වර්ෂ 05 ක කාලය තුළදී ලංකා ධීවර සංස්ථාවේ වෙළඳපොළ කොටස සියයට 1.1 සිට 0.7 දක්වා අඩු වී තිබුණු අතර ඊට හේතු සොයා බලා වෙළඳපල කොටස වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් මත්ස්‍ය මිළ ස්ථායීකරණය කිරීමේ නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම සහ ඉහළ ගුණාත්මකභාවයකින් යුතු පාරිභෝගික සේවාවන් පවත්වා ගැනීම යන අරමුණු ඉටුකර ගැනීමේ හැකියාව අවම වී තිබූ අතර එය සංස්ථාවේ පැවැත්මට අහිතකර ලෙස බලපෑම් ඇති වී තිබුණි.

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිදුවී තිබූ රු.2,558,028 ක් වටිනා ඇසුරුම් තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුතු, ගබඩා අංශයෙහි කළමනාකරුට විරුද්ධව පවත්වන ලද විනය පරීක්ෂණයේදී එම ඌනතාවය, අදාල නිලධාරියාගෙන් අයකර ගැනීමට 2016 මාර්තු 09 දින තීරණය කර තිබුණද , සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල අයකරගෙන නොතිබුණි.

(ආ) රෝහල් සඳහා මසුන් සැපයීමේදී, සිදුකළ වරදක් හේතුවෙන් 2014 අගෝස්තු 12 දින වනවිට රු.මිලියන.13.9 ක හිඟ ණය ශේෂයක් ඇතිකිරීම සම්බන්ධයෙන් ලංකා ධීවර සංස්ථාවේ

විනය නියෝග මාලාවේ "අ" උපලේඛනය යටතට ගැනෙන රාජකාරී පැහැර හැරීම හෝ විෂමාචාරයන්හි යෙදීම යන වරද යටතේ නිලධාරීන් තිදෙනෙකු වෙත ලබාදුන් චෝදනා පත්‍ර සඳහා ලබාදී තිබූ පිළිතුරු පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. තවද ඔවුන්ට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට 2015 පෙබරවාරි 19 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණත් 2016 දෙසැම්බර් 31 වන විටත් එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) රු.192,000 ක මුදල් අක්‍රමිකතාවයක් ඇතුළු අක්‍රමිකතාවයන් 12 කට චෝදනා ලැබ 2001 පෙබරවාරි මාසයේදී විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමකින් තොරව වැඩ තහනමට ලක්ව සිටි සංස්ථාවේ සහකාර කළමනාකරුවෙකු 2001 සැප්තැම්බර් 03 දින නැවත සේවයේ පිහිටුවා පුහුණු වැඩසටහනකට සහභාගී වීම සඳහා විදේශගතවීමට අවස්ථාව ලබාදී තිබුණි. තවද එම නිලධාරියා 2011 ඔක්තෝබර් 03 සිට II ශ්‍රේණියේ විධායක කළමනාකාර තනතුරටද 2011 ඔක්තෝබර් 20 දින සිට I ශ්‍රේණියේ විධායක කළමනාකාර තනතුරට උසස් කර 2015 සැප්තැම්බර් 21 දින සිට ප්‍රධාන කාර්යාලයේ ශීතාගාර කළමනාකරු ලෙස පත්කර තිබුණි.

(ඈ) සංස්ථාව විසින් භුක්ති විඳින දිස්ත්‍රික්ක 08 ක අක්කර 12 .47 ක් වූ ඉඩම් 15 ක් , අදාල පාර්ශවයන් වෙතින් නීත්‍යානුකූලව පවරාගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) ධීවර සංස්ථාවේ සභාපති අමතන ලද 2013 මාර්තු 06 දිනැති අංක එන්පීසී/1/2/6 දරන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික වැඩසටහන් උපදේශකගේ ලිපිය අනුව වටිනාකම රු.මිලියන 15 ක් වූ ත්‍රිකුණාමලය මසුන් අලෙවිසැල 2013 මාර්තු 09 දින සිට සංස්ථාව වෙත පවරාගන්නා ලෙස දන්වා තිබුණද , විගණිත දිනය වූ 2017 දෙසැම්බර් දක්වාම පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ලංකා ධීවර සංස්ථාවෙහි 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් සිදුකල සමීක්ෂණය අනුව වෙළඳ මත්ස්‍ය භෞතික තොගය, පොත් අගය සමඟ සැසඳීමේදී කිලෝග්‍රෑම් 5,939 ක ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර, එම ඌනතාවයට හේතු වූ කරුණු අනාවරණය කරගෙන අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට 2016 දෙසැම්බර් වනවිටත් කටයුතු කර නොතිබුණි.

(උ) සංස්ථාවේ මෙහෙයුම් කළමනාකරු ලෙස කටයුතු කරන ලද නිලධාරියෙකු චෝදනා 11 කට වැරදිකරු වී වැඩ තහනම් කර තිබියදී විනය පරීක්ෂණයට යටත්ව 2009 ජූලි 07 දින සිට නැවත සේවයේ පිහිටුවා විධායකයන් 06 ක කළමනාකාර ධූරයන් සඳහා පත්කර තිබුණි.

(ඌ) 2015 වර්ෂයේදී අභ්‍යන්තර විගණන වාර්තා 03 කින් පෙන්වා දී ඇති අලාභයන් හා අයකරගත යුතු ශේෂ පිළිවෙලින් රු.8,356,253 ක් හා රු.5,139,900 ක් අයකරගැනීමට හා දෙනු ලැබූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කළමණාකාරිත්වය කටයුතු කර නොතිබුණි.

### 3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අතිරේක සේවක සංඛ්‍යාවක් පැවතීම, ඉහළ කළමනාකරණයේ තනතුරුවල සිටින නිලධාරීන් කෙටිකාලීනව වෙනස්වීම යන කරුණු හේතුවෙන් සංස්ථාවේ සැලසුම් නිරන්තරයෙන් වෙනස්වීම සහ කාරක ප්‍රාග්ධන අර්බුදයක් පැවතීම සංස්ථාව 2005 වර්ෂයේ සිට දිගින් දිගටම අලාභ ලැබීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සංස්ථාව ප්‍රතිව්‍යුහගත කර ලාභදායී වාණිජමය ව්‍යාපාරයක් බවට පත්කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩල තීරණයන් මත ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර 2016 මාර්තු 18 දිනැති 02/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි 2016 මැයි 20 දින සේවකයන් 102 දෙනෙකු විශ්‍රාම ගැන්වීම පමණක් නිමකර තිබුණි. සංස්ථාව ලාභදායී වාණිජ ව්‍යාපාරයක් බවට පත්කිරීමේ අරමුණට ළඟාවීම සඳහා අනිකුත් සැලසුම් සකස් කර නොතිබුණි.

(ඇ) සංස්ථාව සතු රු.66,715,516 ක් වටිනා බහුදින ධීවර යාත්‍රා දෙකක් 2010 ජනවාරි 20 දින සිට මාසිකව රු.200,000 ක බදුකුලියකට වසර 2 ක් සඳහා පුද්ගලික ආයතනයකට බදු දී තිබුණද එම යාත්‍රා 02 සඳහා 2011 ජනවාරි සිට 2013 නොවැම්බර් දක්වා නීති නිලධාරිණිය විසින් ගණනය කල හිඟ බදු කුලිය රු.6,000,000 ක් අයකර ගැනීම සම්බන්ධයෙන් මේ දක්වා නීතිමය කටයුතු කරමින් පැවතුණි.

ඉහත සඳහන් යාත්‍රා දෙක 2014 වර්ෂයේදී තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව තෝරාගත් එක් බදුකරුවෙකු වෙත බදු දී තිබුණු අතර 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා යාත්‍රාවලට අදාල රු.1,125,000 ක බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. බදු දීමනා මුදල් අයකර ගැනීම නියමිත ප්‍රමාණයන් යටතේ සිදු කිරීම වෙනුවට එම යාත්‍රා දෙක රු.5,626,500 කට විකුණා තිබීම හේතුවෙන් සංස්ථාව ස්ථාපිත කිරීමේ අරමුණක් වන ඍජුව මුහුදේ යාත්‍රා යොදා මසුන් ඇල්ලීමේ කටයුතු කිරීමේ අරමුණ ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) මාළු අලෙවිය සිදුකරන විධායක 32 අතරින් 2014 වර්ෂයේ විධායකයන් 28 ක් ද, 2015 වර්ෂයේ විධායකයන් 30 ක් ද 2016 වර්ෂයේ විධායකයන් 27 ක් ද අලාභ ලබා තිබුණු අතර , පිළිවෙලින් එම වර්ෂයන්වල ලබා ඇති මුළු අලාභය රු.180,538,573 ක් රු.138,040,828 ක් හා රු.68,184,221 ක් විය.අයිස් යන්ත්‍රාගාර 08 ම 2015 වර්ෂයේ ලබා තිබූ අලාභය රු.33,364,965 ක් හා 2016 වර්ෂයේ රු.17,581,153 ක් විය. සංස්ථාව විසින් අලාභ අවමකර ගැනීම සඳහා වූ සැලසුම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සකස්කර නොතිබුණි.

(ඉ) නියමිත පරිදි පාරිතෝෂික මුදල් නොගෙවීම හේතුකොටගෙන 2013 වර්ෂයේ හා 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.186,678 ක්, රු.1,665,963 ක් හා රු.2,534,850 ක් ලෙස පොළී ගෙවීම්කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට මත්ස්‍ය අලෙවිසැල් 250 ක් ඉදිකිරීමේ ඉලක්කගත අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමකින් තොරව 2010 හා 2011 වර්ෂයන් තුළදී රාජ්‍ය බැංකුවකින් රු.මිලියන 100 ක ණය මුදලක් ලබාගෙන ඒ සඳහා පොලිය ලෙස රු.26,283,673 ක් ගෙවා තිබුණි. 2016 වර්ෂය වනවිට රු.136,092,354 ක් වැයකර අලෙවිසැල් 172 ක් පමණක් ඉදිකර තිබුණි. ප්‍රමාණවත් මසුන් අලෙවියක් නොමැතිවීම හා පාරවල් පුළුල් වීම ආදි කරුණු හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වනවිට එයින් අලෙවිසැල් 75 ක් වසා දමා තිබුණි. තවද ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට පෙර ඉඩම්වල හිමිකම් ලබා නොගැනීම හේතුවෙන් නීතිමය ගැටළු නිරවුල් කරගැනීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

### 3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් අනුරාධපුර පිහිටි පැරණි අතුරු නිෂ්පාදන කම්හලක් , පොළොන්නරුව හා රත්නපුර පිහිටි අයිස් යන්ත්‍රාගාර 02 ක් , පුත්තලම පිහිටි අයිස් යන්ත්‍රාගාරයක් , නිල නිවාසයක් හා කරවල වියලීමේ අංගනයක් , ත්‍රිකුණාමලය පිහිටි දැල් සැකසුම්

මධ්‍යස්ථානයක් , මන්නාරම පිහිටි පැරණි කරවල වියලීමේ අංගනයක් සහ මඩකලපුව පිහිටි බහාලුම් ශීතාගාර කොටස් 03 ක් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව වර්ෂ 02 ත් වර්ෂ 29 ත් අතර වූ කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සංස්ථාවට අයත් වාහන 20 ක් සංස්ථා පරිශ්‍රය තුළ හා අදාල විධායක තුළ නිෂ්ක්‍රියව පවතින බව අභ්‍යන්තර විගණන වාර්තාවක් මගින් හෙළිදරව් කර තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මෙහි ‘‘ස්ව සම්පත් කලාපය’’ සහ පිළිගත් ජාත්‍යන්තර රීතිවලට අනුකූලව ඉන් පිටත මසුන් ඇල්ලීමේ මෙහෙයුම්වල නිරත වීම, විදේශීය වෙළඳපොලවල්වල මසුන් විකිණීම හා දේශීය සහ විදේශීය නිෂ්පාදනයන් සහ බෙදාහරින්නන් නියෝජනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රමෝපාය සැලසුම් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සංස්ථාවෙහි 2014 – 2016 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්මෙහි ආයතන වශයෙන් හා ගෘහස්ථ පාරිභෝගිකයන් ලෙස ඉලක්ක වෙළඳපල හඳුනා ගත හැකිව තිබියදී ගෘහස්ථ පාරිභෝගිකයන් පමණක් ඉලක්ක කර අලෙවිකරණ සැලසුම් සකස් කර තිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්මෙහි ප්‍රගතිය මැනිය හැකි වන පරිදි එක් එක් අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ ඉලක්ක හඳුනාගෙන නොතිබුණි.

**4.2 ක්‍රියාකාරී සැලැස්ම**

සංයුක්ත සැලැස්ම පදනම් කරගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කළ යුතු වුවද ,සංයුක්ත සැලැස්මෙහි ඇතුළත්, ඉහළ ගුණාත්මකභාවයකින් යුතු පාරිභෝගික සේවාවක් පවත්වා ගැනීම, සම්පත් උපයෝජනය සහ කළමනාකරණයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හා මත්ස්‍ය මිල ස්ථායීකරණය කිරීමේ නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම යන අරමුණු ඉටුකරගැනීම සඳහා ක්‍රියාකාරකම් සැලසුම්කර නොතිබුණි.

**4.3 නොවිසඳී ඇති විගණන ඡේද**

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබූ පහත සඳහන් නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි**.**

(අ) 2006 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් සමඟ ඇතිකරගත් බද්ධ ව්‍යාපාරයෙහි කටයුතු 2010 වර්ෂය වනවිට අකර්මන්‍ය වීම නිසා එහි ආයෝජනය කර ඇති ඉඩමේ අයිතිය නැවත ලබාගැනීම.

(ආ) රු.මිලියන 214.4 හිඟ ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කිරීම.

(ඇ) 2017 වර්ෂයේ සිට ඉදිරියට ඇති සැලසුම් ඇතුළත් කර සංයුක්ත සැලැස්ම සකස්කර මාසයක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම්.

(ඇ) යුරෝපා සංගමය විසින් පනවා ඇති තහනම ඉවත් කරන තුරු ධීවරයන්ගේ අතිරික්ත මත්ස්‍ය අස්වනු මිලදීගැනීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ආරම්භ කර තිබූ ටූනා ව්‍යාපෘතියේ අපේක්ෂිත මිලගණන් වලින් බැහැරව එවකට සිටි උප සභාපතිගේ අනුමැතිය මත මසුන් තොග මිලදීගැනීම හා විකිණීම හේතුවෙන් සති 02 ක කාලයක් සඳහා රු.47,359,695 ක අලාභය සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝගය පරිදි ඇමතිතුමාගේ නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩලය සාකච්ඡා කිරීම, ටූනා ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම, මිළ ගණන් තීරණය කිරීම , මිළ තීරණය කිරීමේ කමිටුවක් පැවතීම යන තොරතුරු පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබීම.

## 5 පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ආදායම් පාලනය | විධායකයන් විසින් කරන ලද මසුන් අලෙවිය වෙනුවෙන් ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතීම හා හිඟ ආදායම් වසර ගණනාවක සිට අයකරගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) අයවැය පාලනය | අනුමත කරන ලද අයවැය ගත ගිණුම් විගණනයට ඉදිරිපත් නොකිරීම. |
| (ඇ) තොග පාලනය | ප්‍රශස්ත තොග මට්ටම් තීරණය කර නොමැති වීම හා තොග නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැති වීම. පාරිභෝජනයට නුසුදුසු තොග පැවතීම. |
| | තත්ත්වයෙන් බාල තොග ගබඩා කර තිබීම. |
| | සංස්ථාව සතු මසුන් වෙළඳපොළට නිකුත් කිරීමට නිසි ක්‍රමවේදයක් නොපැවතීම. |
| | පරිභෝජනයට නුසුදුසු තත්ත්වයේ මසුන් හොඳ තත්ත්වයේ මසුන් සමඟ ගබඩාකර තිබීම. |
| (ඈ) වත්කම් උපයෝජනය | බාහිර පාර්ශවයන් සතු මසුන්, නිසි පරිදි අධිශීත නොවීම තුළින් ඒවා නැවත අධිශීත කිරීම වෙනුවෙන් අමතර විදුලි පිරිවැයක් දැරීමට සිදුවීම. |
| | ශීතාගාර වෙත මසුන් ගබඩා කිරීමේදී තත්ත්ව පාලන නිලධාරීන් විසින් ගබඩාවට ලැබෙන මසුන් තොග හොඳ තත්ත්වයේ පවතින බව සහතික කර නොමැති වීම. |